## වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරණ
## මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරතුමා අනුමතිය දුන් දිනය: 1991.04.10)

වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 8 දරණ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම පිණිස විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද සංශෝධිත පරිදි වූ 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනතේ සහ සංශෝධිත පරිදි වූ 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ විධිවිධාන වලට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 8 දරණ මුදල් ප්‍රඥප්තියට 5(4) දරණ අලුත් උප වගන්තිය ඇතුළත් කිරීම.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1990 අංක 8 දරණ මුදල් ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (3) උප වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ ;

(4) 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනතේ 4 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ පළකර ඇති නියමයන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් ආරම්භ වී 1991 මාර්තු 31 දින හෝ මෙම වගන්තියේ (1) උප වගන්තිය යටතේ නියමයන් පලකළ දිනය යන දින දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා වූ කාල පරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අදාළ වන ප්‍රමාණයට මෙම වගන්තියේ (1) උප වගන්තිය යටතේ පලකළ නියමයන් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7(5) අලුත් උප වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (4) උප වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(5) 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ තීරණය කොට පළකර ඇති යම් ව්‍යාපාරයක් වෙනුවෙන් වූ පිරිවැටුම් බදු අනුප්‍රමාණයන් මෙම

ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් ආරම්භ වී 1991 මාර්තු 31 වැනි දින හෝ මෙම වගන්තියේ (1) උප වගන්තිය යටතේ පිරිවැටුම් බදු අනුප්‍රමාණයන් පලකළ දිනය යන දින දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා වූ කාලපරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අදාළ වන ප්‍රමාණයට මෙම වගන්තියේ (1) උප වගන්තිය යටතේ තීරණය කොට පළ කරන ලද අනුප්‍රමාණයන් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37(ඇ) අලුත් උප ඡේදය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වගන්තියේ (ඇ) උප ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් උප ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(ඈ) 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ 2 ඡේදය යටතේ නියම කොට පළකර ඇති මුද්දර ගාස්තු අනුප්‍රමාණයන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් ආරම්භ වී 1991 මාර්තු 31 වැනි දින හෝ මෙම වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙම වගන්තිය යටතේ මුද්දර ගාස්තු අනුප්‍රමාණයන් පළකළ දිනය යන දින දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා වූ කාලපරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අදාළ වන ප්‍රමාණයට මෙම වගන්තිය යටතේ නියම කොට පළ කරන ලද මුද්දර ගාස්තු අනුප්‍රමාණයන් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102(6) වගන්තිය 102(7) වගන්තිය වශයෙන් නැවත අංක කිරීම.

5. 1991 අංක 2 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 8 වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ අලුතින් ඇතුළත් කළ 102 (6) වගන්තිය, 102(7) වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 (6) අලුත් උප වගන්තියට ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වගන්තියේ (5) උප වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(6) මෙම වගන්තියේ ඉහතින් වූ විධිවිධාන වල කුමක් සඳහන්ව ඇතද, කොමසාරිස්වරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා බලය

දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ මේ ප්‍රඥප්තිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සැළකිල්ල ඇතිව, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්-

(අ) ඒ ප්‍රදේශයේ පිරිවැටුම් බදු ගෙවන්නන්ගේ නම් සහ ලිපිනයන් ;

(ආ) ඒ එක් එක් බදු ගෙවන්නා විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය පිළිබඳ විස්තර ; සහ

(ඇ) කාර්තුවක් සඳහා ඒ එක් එක් පිරිවැටුම් බදු ගෙවන්නා විසින් ප්‍රකාශිත පිරිවැටුම

ඇතුළත් ලැයිස්තුවක්, අවස්ථානුකූල යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන ආකාරයකින් පළ කරනු ලැබීමට සැලැස්විය හැකිය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ;

පළාත් ආදායම් දිරිගැන්වීමේ අරමුදල.

104 අ(1) (මේ වගන්තිය මින් මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් ආදායම් දිරිගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) 1991 ජනවාරි 1 දායින් ආරම්භ වන වර්ෂය වෙනුවෙන් පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සැලැස්විය හැකි පරිපූරක ප්‍රදානයක් මගින්ද, ඉන් පසුව එක් එක් වර්ෂය වෙනුවෙන් පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලැබීමෙන් ද යම් මුදල් එම අරමුදලේ කාර්යය සඳහා අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(3) (අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ ශුභ සාධනය සඳහා අවශ්‍ය සියළු මුදල් ; සහ

(ආ) කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් පනතක් ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යක්ෂමතාවය සහතික කිරීම පිණිස අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට දිරිගැන්වීමේ දීමනා

අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(4) කොමසාරිස්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතුය.

**මෙම ප්‍රඥප්තියේ 2,3,4, හා 7 යන වගන්ති අතීතයට බලපෑම.**

8. මෙම ප්‍රඥප්තියේ 2,3,4 හා 7 වගන්තීන් මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1991 ජනවාරි මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියළු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.